# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2065/37 – 2018 අප්‍රේල් මස 05 වැනි බ්‍රහස්පතින්දා – 2018.04.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පළාත් සභාව

2016 වර්ෂයේ අංක 09 දරන උතුරු පළාතේ පළාත් සභාවේ දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය

උතුරු පළාත් පළාත් සභාව විසින් 2017 වර්ෂයේ ජනවාරි 10 වෙනි දින සම්මත කරන ලද 2016 වසරේ අංක 09 දරණ දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය සඳහා උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2018 වර්ෂයේ අප්‍රේල් මස 02 වෙනි දින අනුමැතිය ලබා දී තිබෙන බව මෙමගින් දැනුවත් කරනු ලැබේ.

**කේ. තෙයිවේන්ත්‍රම්,**
ලේකම්,
සභා ලේකම් කාර්යාලය,
උතුරු සභාව.

සභා ලේකම් කාර්යාලය,
ඒ9 මාර්ගය,
කයිතඩි,

2018 අප්‍රේල් 03.

1A – PG3976 – 27 (2018/04)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මෙය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 09 වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ සඳහන් පරිදි ''දේශීය වෛද්‍ය ක්‍රමය' විෂය ක්‍රියාත්මක කර ගනිමින්, දේශීය වෛද්‍ය ක්‍රමය උපයෝගී කර උතුරු පළාතේ මහජනයාගේ රෝග වැළැක්වීම, රෝග නිවාරණ, සෞඛ්‍ය අධ්‍යාපනය සහ දේශීය වෛද්‍ය ප්‍රජා සෞඛ්‍ය සේවාවන් ආරම්භ කර නඩත්තු කිරීම, දේශීය වෛද්‍ය කටයුතු දියුණු කිරීම සහ සුරැකීම.දේශීය වෛද්‍ය ආයතන පිහිටුවීම, නඩත්තු කිරීම, සංවර්ධනය කිරීම සහ ඊට අවශ්‍ය පහසුකම් සපයා දීම, ඔසු උද්‍යාන ආරම්භ කර නඩත්තු කිරීම සහ විස්තීර්ණ කිරීම සඳහාත්, උතුරු පළාතේ දේශීය වෛද්‍ය ආයතන සහ දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයන් ලියාපදිංචි කිරීම සහ එකී ක්‍රියාකාරකම් විධිමත් කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහාත්, ඊට අදාළ සහ සම්බන්ධිත කරුණු සඳහාත් විධිවිධාන සැළැස්වීම සඳහා වූ ප්‍රඥප්තිය වන්නේ ය. (මෙම ප්‍රඥප්තියේ විධිවිධාන 1961 වසරේ අංක 31 දරන ආයුර්වේද පනතට අනනුකූල වේ.)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු පළාතේ පළාත් සභාව විසින් මෙලෙස ප්‍රඥප්ති පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

1. මෙම ප්‍රඥප්තිය උතුරු පළාතේ පළාත් සභාවේ 2016 වසරේ අංක 09 දරන දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර උතුරු පළාතේ ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබන දිනයේ සිට එය ක්‍රියාත්මක වන්නේ ය.

## I වන කොටස

### පළාත් දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව පිහිටුවීම, එහි සංයුතිය සහ කාර්‍යය වගකීම්.

පළාත් දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව පිහිටුවීම.

2. මෙම ප්‍රඥප්තියේ අරමුණු ඉටු කිරීම පිණිස උතුරු පළාතේ දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව යන්නෙන්, හඳුන්වනු ලබන (මෙහි මින්මතු දෙපාර්තමේන්තුව යනුවෙන් සඳහන් වේ) දෙපාර්තමේන්තුව මෙයින් පිහිටුවනු ලැබේ.

උතුරු පළාත් දේශීය වෛද්‍ය කොමසාරිස් සහ සේවක මණ්ඩලය.

3. (i) මෙම ප්‍රඥප්තියේ මෙයින් පසුව "කොමසාරිස්'යන්නෙන් සඳහන් කරනු ලබන "උතුරු පළාත් දේශීය වෛද්‍ය කොමසාරිස්" තනතුරට සුදුසුකම් පදනමින් නිලධාරියෙකු පත් කරනු ලැබේ. මොහු දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන්නේ ය. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන අමාත්‍යංශ ලේකම්වරයාගේ නියෝගයට අනුකූලව ක්‍රියාත්මක කිරීමේ වගකීම මොහු සතු වන්නේ ය.

(ii) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට කොමසාරිස්වරයාට සහායවීම පිණිස අවශ්‍ය දේශීය වෛද්‍ය නියෝජ්‍ය කොමසාරිස්වරුන්, නිලධාරීන් සහ දේශීය වෛද්‍යවරුන් ඇතුළත් වන පරිදි පත් කළ හැකි වන්නේ ය.

(iii) දේශීය වෛද්‍ය කොමසාරිස්වරයා, නියෝජ්‍ය කොමසාරිස්වරයා හැර දෙපාර්තමේන්තුවට අයත් කාර්ය මණ්ඩලය පත් කිරීම්, තනතුරු උසස්වීම් ලබාදීම්.විනයානුකූල පරීක්ෂණ පැවැත්වීම් සහ තනතුරින් ඉවත් කිරීම් යනාදිය 1987 වසරේ අංක 42 දරන පළාත් සභා පනතේ IV වන කොටසට අනුකූලව තිබිය යුතු වන්නේ ය.

(iv) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමට පෙර දෙපාර්තමේන්තුවේ අනුමත කරන ලද තනතුරුවල හෝ සේවයේ සිටින සියළුම කාර්යමණ්ඩලය මෙම ප්‍රඥප්තියට අනුව පත් කරන ලද පුද්ගලයන් වශයෙන් අදහස් කරනු ලැබේ.

(v) මෙම ප්‍රඥප්තියට අනුව තමන්ට පවරාදුන් බලතල සහ යුතුකම් වලින් කිසිවක් කොමසාරිස්වරයා විසින් සුදුසු නිලධරයන් වෙත පැවරිය හැකි ය.

4. දෙපාර්තමේන්තුවේ අරමුණු පහත දැක්වෙන පරිදි වන්නේ ය. දෙපාර්තමේන්තුවේ අරමුණු.

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 09 වන උපලේඛනයේ 01 වන ලැයිස්තුවේ 12 වන වගන්තිය යටතේ සඳහන් ආකාරයට දේශීය වෛද්‍ය රෝහල් සහ ආයතන පිහිටුවීම සහ නඩත්තු කිරීම්, සේවාවන් ලබාදීම.

(ii) දේශීය වෛද්‍ය ක්‍රමයට අනුව උතුරු පළාත් මහජනයාගේ සෞඛ්‍ය තත්ත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා රෝග නිවාරණ සහ සෞඛ්‍ය අධ්‍යාපනික කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාම.

(iii) දේශීය වෙදකමට අවශ්‍ය ඔසු පැල වගා කිරීම, ආරක්ෂා කිරීම හා නඩත්තු කිරීම.

(iv) (අ) දේශීය පාරම්පරික යෝගා ක්‍රමවේදයන් හා අනෙකුත් විකල්ප වෛද්‍ය ක්‍රම (ආයුර්වේද, සිද්ධ, යුනානි) යනාදි නාමයෙන් නැතහොත් එයට අනුව අවශ්‍ය යැයි හැඟෙන කුමන හෝ බෙහෙත් ශාලාවක්, රෝහලක්, ඖෂධ අලෙවි ස්ථානයක්, සිරුර මැඩීම කරන (සම්බාහන) (Masseur) ආයතනයක් නැතහොත් ඖෂධ නිෂ්පාදන ස්ථානයක් නියාමනය කිරීම. (ආ) පළමුවන වගන්තියේ සඳහන් කරුණු නියාමනය කිරීමේ දී පළාත් පාලන ආයතනවලට අවශ්‍ය උපදෙස් ලබාදීම, මගපෙන්වීම හා පහසුකම් සපයා දීම.

5. දෙපාර්තමේන්තුවේ කාර්‍යයන් පහත දැක්වෙන පරිදි වන්නේ ය. දෙපාර්තමේන්තුවේ කාර්යයන්

(i) දේශීය වෛද්‍ය සේවාවන් සපයනු ලබන රෝහල්, බෙහෙත් ශාලාවන් සහ දේශීය වෛද්‍ය ක්‍රමවලට අදාළව රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා අවශ්‍ය වන වෙනත් ආයතන පිහිටුවීම, එකී ආයතනවල ඵලදායීතාවයෙන් යුත් සහ කාර්‍යක්‍ෂමතාවයෙන් යුත් දේශීය වෛද්‍ය සේවාවන් පවත්වාගෙන යාම සහ නියාමන කිරීම.

(ii) දේශීය වෛද්‍ය ක්‍රමයට අනුව පළාතේ මහජනයාගේ සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම පිණිස සෞඛ්‍ය වැඩ සටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම.

(iii) පළාතේ අවශ්‍යතාවය අනුව දේශීය වෛද්‍ය ක්‍රමවේදයෙන් යුත් රෝහල්, ආයතන පිහිටුවා නඩත්තු කිරීම හා පරිපාලනය කිරීම.

(iv) රෝග ප්‍රතිකාර සේවාවන්වල ප්‍රමිතිය (Quality) ප්‍රවර්ධනය කිරීම පිණිස හා දේශීය වෛද්‍ය ක්‍රමය ජනප්‍රිය කිරීම (Populatize) පිණිසඅවශ්‍ය වන ක්‍රමවේද සකස් කිරීම.

(v) දේශීය වෛද්‍ය ආයතන වල සේවය කරන කාර්ය මණ්ඩලයට අවශ්‍ය කරන දැනුම සහ පුහුණු ලබාදීම.

(vi) දේශීය වෛද්‍ය ක්‍රියාකාරකම්වල යෙදෙන පෞද්ගලික ආයතන හෝ රාජ්‍ය නොවන ආයතන, අර්ධ (Semi) රාජ්‍ය ආයතන සහ සමූපකාර සමග සම්බන්ධිත ආයතන ලියාපදිංචි කිරීම සහ එකී කාර්‍යයන් කරගෙන යෑමේ දී අදාල ආයතන වලින් අනුගමනය කළයුතු මග පෙන්වීම්. ගුණාත්මකභාවය සහ මූලික මූලධර්ම සම්පාදනය කිරීම, ඒවා ක්‍රියාත්මක කිරීම, අධීක්‍ෂණ කිරීම සහ නියාමන කිරීම.

(vii) ඔසු උයන් පිහිටුවීම හා නඩත්තු කිරීම.

(viii) ඖෂධ ශාක රෝපනය කිරීමට උනන්දු කරවීම සහ ඒ හා සම්බන්ධිත දැනුම වර්ධනය කිරීම.

(ix) ජාතික ප්‍රතිපත්තිය සහ අනුමත කළ ප්‍රමිතියට අදාල වන ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහා ඖෂධ නිෂ්පාදන මධ්‍යස්ථාන පිහිටුවා, පවත්වාගෙන යාම සහ දෙපාර්තමේන්තුව මගින් නඩත්තු කරගෙන යනු ලබන ආයතනවලට ඖෂධ නිකුත් කිරීම.

(x) පළාතේ ප්‍රජා සෞඛ්‍ය සේවාවන් ව්‍යාප්ත කිරීම මගින් මහජනයාගේ සෞඛ්‍ය තත්ත්වය ප්‍රවර්ධනය කිරීම, රෝග වැලැක්වීමේ ක්‍රමවේදයන් ප්‍රවර්ධනය කිරීම, පාරම්පරික වෛද්‍ය ක්‍රමවේදයන් ආරක්ෂා කිරීම.හදිසි ආපදා හා විපත් අවස්ථාවන්හි සේවාවන් සැපයීම.

(xi) ජාතික ප්‍රතිපත්තිය සහ අනුමත කළ ප්‍රමිතියට අදාළ වන සේ දේශීය වෛද්‍ය සේවාවන්ට අවශ්‍ය වන ඖෂධ නිෂ්පාදනයට උනන්දු කිරීම සහ ඒ සම්බන්ධිත දැනුම වර්ධනය කිරීම.

(xii) පළාතේ මහජනයාගේ සෞඛ්‍යය සහ එය නගා සිටුවීම උදෙසා ස්ථාපිත කරනු ලබන දේශීය වෛද්‍ය සේවාවන්ට අදාල දත්ත එක්රැස් කිරීම සහ හෙළිකිරීම.

(xiii) දේශීය පාරම්පරික වෛද්‍ය ක්‍රමය සම්බන්ධ තොරතුරු එක්රැස් කිරීම, ආරක්‍ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම.

(xiv) දෙපාර්තමේන්තුවේ කාර්‍යයන් සහ වගකීම් ඉටු කිරීම පිණිස රජයේ ප්‍රතිපත්තියට අදාල වන සංවර්ධන කාර්‍යයන් සඳහා සුදුසු සම්පත් හා යෝජනා ලබාගැනීම.

(xv) ජාතික ප්‍රතිපත්තියට අදාල වන පරිදි පළාත් දේශීය වෛද්‍ය ප්‍රතිපත්ති නිසි ලෙස සකස් කිරීම.

දෙපාර්තමේන්තුවේ බලතල.

6. (i) මෙම ප්‍රඥප්තියේ සඳහන් කරනු ලබන දෙපාර්තමේන්තුවේ අරමුණු සපුරාලීම පිණිස සහ ඊට පවරා ඇති කාර්‍යයන් ඉටු කිරීම අත්‍යවශ්‍ය වන සියළුම බලතල නීතියේ සීමාවන්ට ඇතුළත්ව දෙපාර්තමේන්තුවට අයත් වන සේ තිබිය යුතු වන්නේ ය.

(ii) මෙම ප්‍රඥප්තිය යටතේ සඳහන් කරනු ලබන අරමුණු සහ කාර්‍යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු, ලේඛන හෝ වාර්තා කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද තැනැත්තා විසින් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන යම් දේශීය වෛද්‍ය ආයතනයකින් හෝ පෞද්ගලික තැනැත්තෙකුගෙන් ඉල්ලීමක් කළවිටක, එකී ආයතනය හෝ පෞද්ගලික තැනැත්තා විසින් ඒ තොරතුරු, ලේඛන හෝ වාර්තා ලබා දිය යුතු වන්නේ ය.

## II වන කොටස

### දේශීය වෛද්‍ය ආයතන

7. දේශීය වෛද්‍ය ආයතනයක් පළාත තුළ ක්‍රියාත්මක වීමට නම්. (දේශීය වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීම.)

(i) නිවැරදිව ලියාපදිංචි කරන ලද ආයතනයන් සියල්ල කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයෙන් පළ කළයුතු ය.

(ii) කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකයක් නොමැතිව කිසිදු දේශීය වෛද්‍ය ආයතනයක් පළාත තුළ පවත්වාගෙන යාම හෝ ක්‍රියාත්මක කිරීම නොකළ යුතු වන්නේ ය

8. (i) දේශීය වෛද්‍ය ආයතනයක් වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම නියමිත ආකෘතියට අනුව සම්පූර්ණ කර කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ ය. (ලියාපදිංචි කළ දේශීය වෛද්‍ය ආයතනයන් සම්බන්ධව කොමසාරිස්වරයාගේ බලතල සහ කර්තව්‍යය.(Powers and Task))

(ii) එවන් ඉල්ලුම් පත්‍රයක් පළාත් කොමසාරිස්වරයා විසින් අනුමත කළවිට එම දේශීය වෛද්‍ය ආයතනය ලියාපදිංචි කර, ඉල්ලුම්කරුට ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබේ, එකී පරිශ්‍රය (Premises) අදාල දේශීය වෛද්‍ය ආයතනයක් ලෙස ලියාපදිංචි කළ යුතු ය.

(iii) ඉල්ලුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවේ මෙම ප්‍රඥප්තිය යටතේ දේශීය වෛද්‍ය ආයතනයක් ලෙස ලියාපදිංචි කිරීම සම්බන්ධව පනවනු ලබන රෙගුලාසි / රීති වලට අදාල නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කර, ඒ සම්බන්ධව ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැනුම් දීමට පියවර ගත යුතු වන්නේ ය.

(iv) ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමේ කොමසාරිස්වරයාගේ තීරණය සම්බන්ධව අතෘප්තියට පත් වූ යම් ඉල්ලුම්කරුවෙකු විසින් එකී තීරණයෙන් කොමසාරිස්වරයා විසින් පෙන්නුම් කළ හේතුන් / අඩුපාඩු නිවැරදි කිරීමෙන් පසුව, ඉල්ලුම්කරු නැවතත් ඉල්ලුම් කළ හැකි වන්නේ ය.

(v) ලියාපදිංචි කිරීමේ ගාස්තු පළාත් විෂයය භාර අමාත්‍යවරයා විසින් පනවනු ලබන රීති මගින් නියම කළ යුතු වන්නේ ය.

(vi) නීතියේ සාමාන්‍ය සීමාවන්ට ඇතුළත්ව කොමසාරිස්වරයාගෙන් ලිඛිත අනුමැතියලත් යම් තැනැත්තෙකු විසින් දේශීය වෛද්‍ය ආයතනයක් ලෙස ලියාපදිංචි කරන ලද යම් ආයතනයකට හෝ පරිශ්‍රයට (Premises) අවශ්‍ය වන ඕනෑම වේලාවක ඇතුළු වී.

(අ) එකී පරිශ්‍රයට (Premises) ඇතුල්වී පරීක්ෂා කිරීමටත්.

(ආ) එහි සිටින යම් තැනැත්තෙකුගෙන් හෝ රෝගියෙකුගෙන් කරුණු විමසීමට.

(ඇ) එය තුළ පවත්වාගෙන යනු ලබන යම් ලියකියවිලි හෝ වාර්තා පරීක්ෂා කිරීමට සහ එකී ලියකියවිලි හෝ වාර්තා වල පිටපත් ගැනීමට.

(ඈ) එකී පරිශ්‍රයේ (Premises) හිමිකරු සහ භාරව සිටින තැනැත්තෙකු සම්බන්ධව මෙම ප්‍රඥප්තියේ විධිවිධාන හෝ ඒ යටතේ පනවනු ලබන රීතිවලට හෝ රෙගුලාසිවලට අදාළව පියවර ගැනීම පිණිස උපදෙස් හෝ නියෝග ලබාදීමට, බලය ඇත්තේ ය.

9. මෙම ප්‍රඥප්තිය යටතේ කාර්‍යයන් සහ කර්තව්‍යයන් (Tasks)ඉටු කිරීමේ දී, කොමසාරිස්වරයා විසින් පොලිසීයේ සහාය ඉල්ලා සිටි හැකි ය.

### III වන කොටස

දේශීය වෛද්‍ය සේවානියුක්තිකයන් ලියාපදිංචි කිරීම.

10. (i) දෙපාර්තමේන්තුව විසින් නියම කර ඇති පරිදි බලපත්‍රයක් ලබාගෙන නොමැති නම් කිසිම පුද්ගලයෙකුට දේශීය වෛද්‍ය කටයුතු වල නියැලිය නොහැකිය.

(ii) දේශීය වෛද්‍ය සේවයේ නිරතව සිටින නිරත වීමට නියමිත සෑම පුද්ගලයෙකුම, මේ සඳහා පනවනු ලැබූ ක්‍රියාපටිපාටි වලට අනුකූලව තමන්ගේ ඉල්ලුම්පත්‍ර ලිඛිතව කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

(iii) ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබූ ඉල්ලුම්කරුවකු විසින් නැවතත් ඉල්ලුම් කළ හැකි වන්නේ ය.

දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකු වශයෙන් ලියාපදිංචි වීමට අවශ්‍ය සුදුසුකම්.

11. යම්කිසි පුද්ගලයෙකු, දේශීය වෛද්‍ය සේවයේ නියුක්තිකයෙකු වශයෙන් අදාළ ලේඛනයේ ලියාපදිංචි වීම සඳහා ඔහු.

(i) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

(ii) පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරනු ලැබූ මෙම ප්‍රඥප්තිය යටතේ පළ කරන ලද විධිවිධාන අනුව නිශ්චය කරන ලද සුදුසුකම්ලත් අයෙකු විය යුතු ය.

දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකු වශයෙන් ලියාපදිංචිය අත්හිටුවීම හෝ අවලංගු කිරීම.

12. (1) යම් දේශීය වෛද්‍ය සේවා නියුතු තැනැත්තෙකු යම්කිසි වරදකට, නිසි අධිකරණ බලයකින් යුත් අධිකරණයක් මගින් වරදකරු බවට තීරණය කරනු ලැබූ අවස්ථාවක කොමසාරිස්වරයා විසින් එකී සේවා නියුක්තිය ලියාපදිංචි කිරීම අත්හිටුවීමට හෝ ලියාපදිංචි කිරීමක් අවලංගු කිරීම කළ යුතු වන්නේ ය.

ලියාපදිංචි ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් අභියාචනා කිරීම.

13. (i) 12 වන වගන්තිය යටතේ ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමේ කොමසාරිස්වරයාගේ තීරණය සම්බන්ධව අතෘප්තියට පත් වූ අයදුම්කරුවෙකු විසින් එකී තීරණය දැනුම් දුන් දිනයේ සිට දවස් විසි එකක් (21) ඇතුළත එකී තීරණයට විරුද්ධව ලේකම්වරයා වෙත අභියාචනය කළ හැකි වන්නේ ය

(ii) ලේකම්වරයා විසින් එකී අභියාචනය තමන්ට ලැබී දවස් තිහක් (30) ඇතුළත තම තීරණය ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු වන්නේ ය.

දේශීය වෛද්‍ය යටතේ ආයුර්වේදය"සිද්ධ" යූනානි" පාරම්පාරික වෙදකම" යන පද භාවිතා කිරීම.

14. උතුරු පළාතේ භාණ්ඩ හෝ සේවාවන් ලබාදීමේ දී ආයුර්වේදය, සිද්ධ, යූනානි, පාරම්පාරික වෛද්‍ය ක්‍රම යන පද කොමසාරිස්වරයාගේ ලිඛිත අවසරයකින් තොරව භාවිතා නොකළ යුතු වන්නේ ය.

### IV වන කොටස

#### වැරැදි සහ දඬුවම්

15. ලියාපදිංචි වීම නොකර, දේශීය වෛද්‍ය ආයතනයක් පවත්වාගෙන යන තැනැත්තෙකු, මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී වරදකරු ලෙස පෙනී ගියහොත්, රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි සිර දඬුවමකට හෝ එකී දඩ මුදල සහ සිර දඬුවම් යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු වන්නේ ය.

16. ලියාපදිංචි වීම නොකර, දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකු වශයෙන් කටයුතු කරනු ලබන යම් තැනැත්තෙකු, මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී වරදකරු ලෙස පෙනී ගියහොත්, රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි සිර දඬුවමකට හෝ එකී දඩ මුදල සහ සිර දඬුවම් යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු වන්නේ ය.

17. මෙම ප්‍රඥප්තියේ සඳහන් විෂයන්හි නිරත නිලධාරියෙකුගේ ක්‍රියාවන්ට බාධා කරන හෝ මෙම ප්‍රඥප්තියේ සඳහන් විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙකු, මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී වරදකරු ලෙස පෙනී ගියහොත්, රුපියල් පන් දහසකට නොඅඩු රුපියල් විසිපන් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට (06) නොවැඩි සාමාන්‍ය සිර දඬුවමකට හෝ එකී දඩ මුදල සහ සිර දඬුවම් යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු වන්නේ ය.

18. මෙම ප්‍රඥප්තිය යටතේ සම්පාදනය කරනු ලබන නීති රීති හා රෙගුලාසි යනාදිය උල්ලංඝනය කරන කවර හෝ යම් තැනැත්තෙකු වරදක් කරනු ලබන්නේ නම්, මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී වරදකරු ලෙස පෙනී ගියහොත්, රුපියල් ලක්ෂ දෙකකට නොවැඩි දඩයකට හෝ මාස දොළහකට නොවැඩි සිර දඬුවමකට හෝ එකී දඩ මුදල සහ සිර දඬුවම් යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු වන්නේ ය.

## V වන කොටස

### පළාත් දේශීය වෛද්‍ය සේවා උපදෙස් කාරක සභාව

19. පළාත් දේශීය වෛද්‍ය සේවා සැලැසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධව පළාත් දේශීය වෛද්‍ය සේවා උපදේශක මණ්ඩලය අමාත්‍යවරයා විසින් පත් කළ යුතු වන්නේ ය. *පළාත් දේශීය වෛද්‍ය සේවා උපදේශක මණ්ඩලය*

20. (1) පළාත් දේශීය වෛද්‍ය සේවා උපදෙස් මණ්ඩලය (මින්මතු උපදේශක මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන) පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු වන්නේ ය. *පළාත් දේශීය වෛද්‍ය සේවා උපදේශක මණ්ඩලයේ සංයුතිය*

(අ) ලේකම්වරයා,

(ආ) කොමසාරිස්වරයා,

(ඇ) පළාත් දේශීය වෛද්‍ය සේවයේ අධ්‍යක්ෂකවරයා හෝ ඔහුගේ නියෝජිතවරයෙකු,

තව ද සාමාජිකයන් වශයෙන් පහත සඳහන් අය පත් කරනු ලැබේ.

(ඈ) යාපනය, කිලිනොච්චිය, මුලතිවු, වවුනියාව හා මන්නාරම දිස්ත්‍රික්ක පහෙන් ම නියෝජනය වන පරිද්දෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම් ලැබූ රාජ්‍ය සේවයේ නොවන, ප්‍රවීණතාවයෙන් යුත් දේශීය වෛද්‍ය නියුක්තිකයන්/වෛද්‍යවරුන් හත් දෙනෙකු. ( සිද්ධ 05ක්, යුනානි 01ක්, ආයුර්වේද 01ක්)

(ඉ) සමාජ සංවිධාන නියෝජනය වන පරිද්දෙන් පත් කරනු ලබන උසස් වෘත්තිකයෙකු

(ii) උපදේශක මණ්ඩලයේ සභාපතිවරයා විෂයභාර අමාත්‍යවරයා විසින් නම සඳහන්ව පත් කරනු ලබන අතර කොමසාරිස්වරයා එහි ලේකම්වරයා වන්නේ ය.

(iii) (අ) උපදේශක මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය අවුරුදු දෙකක් (02) වන්නේ ය.

(ආ) පත් කරනු ලැබූ සාමාජිකයෙකු, ඉල්ලා අස්වීම,මිය යාම විෂය භාර අමාත්‍යවරයා විසින් තනතුරින් ඉවත් කිරීම හෝ අන්‍යාකාරයෙන් ධුරය අත් හැරීම හෝ ධුර කාලයට පෙර ධුරය අත් හැරියොත් මිස සියලුම පත් කරනු ලැබූ සාමාජිකයන් පත් කරනු ලැබූ දිනයේ සිට අවුරුදු දෙකකට ධුරය දැරිය යුතු අතර නැවතත් පත් කරනු ලැබීමට සුදුස්සන් වන්නේ ය.

(ඇ) පත් කරනු ලැබූ සාමාජිකයෙකු මිය යාම, ඉල්ලා අස්වීම, අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කිරීම හෝ අන්‍යාකාරයෙන් ධුරය අත් හරිනු අවස්ථාවේ දී අමාත්‍යවරයා විසින් එකී සාමාජිකයාගේ ඉතිරි වී ඇති ධුර කාලය සඳහා වෙනත් සුදුසුකම් ඇති සාමාජිකයෙකු පත් කරනු ලැබිය යුතු වන්නේ ය.

(i) පත් කළ සාමාජිකයෙකු, අමාත්‍යවරයාට කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මගින් ඕනෑම අවස්ථාවක තම ධුරයෙන් ස්වකීය කැමැත්තෙන් ඉල්ලා අස්වීමට හැකි ය.

(ii) අවම වශයෙන් මාස තුනකට එක් වතාවක්වත් උපදෙස් මණ්ඩලය රැස්විය යුතු වන්නේ ය.

(iii) උපදෙස් මණ්ඩලයේ ගණපූරණය සාමාජිකයන් 04 දෙනෙකුගෙන් යුතු වන්නේ ය.

උපදේශක මණ්ඩලයේ කාර්‍ය්‍ය භාරය.

21. උපදේශක මණ්ඩලයට යවනු ලබන කරුණු සම්බන්ධව විෂයභාර අමාත්‍යවරයාට සුදුසු ආකාරයෙන් නිරීක්ෂණ, නිර්දේශ, උපදෙස් ඉදිරිපත් කිරීම, පළාත් දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවේ සේවාවන් දියුණු කිරීම, පළාතේ සෞඛ්‍ය තත්ත්වය සංවර්ධනය කිරීම යනාදි ක්‍රියාදාමයන් සම්බන්ධව වරින්වර නිර්දේශ සහ යෝජනා ඉදිරිපත් කිරීම එකී උපදෙස් මණ්ඩලයේ කාර්‍ය්‍ය වගකීම් වන්නේ ය.

## VI වන කොටස

### රෝහල සංවර්ධන කමිටුව

රෝහල සංවර්ධන කමිටුව ස්ථාපිත කිරීම සහ එහි සංයුතිය (Composition)

22. (i) මෙම ප්‍රඥප්තියට අයත් පළාත් දේශීය වෛද්‍ය රෝහල්, අනිකුත් රෝහල්, දිස්ත්‍රික්ක රෝහල් යන ඒවා සඳහා වන සංවර්ධන කමිටු (මෙහි මින්මතු කමිටු යන්නෙන් හඳුන්වනු ලබන) ලේකම්වරයා විසින් පත් කළ හැකි වන්නේ ය.

(ii) රෝහල් සංවර්ධන කමිටුවේ සංයුතිය පහත සඳහන් ආකාරයෙන් විය යුතු වන්නේ ය.

(අ) අදාළ කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් හෝ ඔහුගේ නියෝජිතවරයෙකු,

(ආ) අධ්‍යක්ෂක/ වෛද්‍ය අධිකාරිවරයා/ කාර්ය භාර වෛද්‍ය නිලධාරියෙකු,

(ඇ) අදාළ ආයතනය පිහිටා ඇති ප්‍රදේශයේ පවත්වා ගෙන යනු ලබන ප්‍රජා සංවිධාන නියෝජිතයන් දෙදෙනෙකු,

(ඈ) ප්‍රදේශයේ සිටින අදාළ රෝහලට සම්බන්ධ නොවන ලියාපදිංචියලත් දේශීය වෛද්‍යවරයෙකු,

(ඉ) රෝහලේ සේවක මණ්ඩලයේ නියෝජිතයන් දෙදෙනෙකු.

(iii) ඉහත සඳහන් නියෝජිතයන් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය සමගින් පත් කළ යුතු තැනැත්තන් වන්නේ ය.

(iv) සාමාජිකයන් අතරේ ඡන්දයෙන් තෝරා පත් කර ගන්නා ලද තැනැත්තා, මෙම කමිටුවේ ලේකම්වරයා වන අතර, ආයතනය භාර වෛද්‍ය නිලධාරියා නිල බලයෙන් මෙම කමිටුවේ සභාපතිවරයා වී සිටින්නේ ය.

(v) (අ) මෙම කමිටුවේ ධුර කාලය අවුරුදු දෙකක් (02) වන්නේ ය.

(ආ) විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාවය සමගින් පත් කරනු ලබන සාමාජිකයන්ගේ ධුර කාලය කවර ආකාරයක හේතුවක් මත නියමිත දිනයට පෙර, ධුරය අත්හැරියහොත්, එසේ අත්හරින ලද ධුරයට වෙනත් තැනැත්තෙකු එකී වගන්ති වල විධිවිධාන වලට යටත්ව පත් කිරීම විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය සමගින් කටයුතු කළ හැකි වන්නේ ය. එලෙස පත් කරනු ලබන සාමාජිකයෙකුට තමාගේ අනුප්‍රාප්ත(Successor) සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ගිය ධුර කාලයට පමණක් ධුරය දැරිය හැකි වන්නේ ය.

(ඇ) පත් කරනු ලැබූ සාමාජිකයෙකුව.සාධාරණ හේතුවක් මත ධුරයෙන් අස් කිරීමේ බලය විෂයභාර අමාත්‍යවරයාට ඇත්තේ ය. කවර හෝ පත් කරනු ලැබූ සාමාජිකයෙකු ස්වකීය කැමැත්තෙන් ධුරයෙන් ඉල්ලා අස්වීමට හිමිකම ඇත්තේ ය.

(VI) සියලුම රැස්වීම්වලට සභාපතිවරයා මුලසුන දරයි.

(VII) මෙම කමිටුවේ ලේකම්වරයා රැස්වීම් සඳහා වූ වාර්තා ඔහු විසින් ම සකස් කරනු ලබන්නේ ය.

(VIII) රෝහලක සංවර්ධන කමිටුවේ ගණපූර්ණය තුනක්ව තිබිය යුතු වන්නේ ය.

(IX) මණ්ඩලයේ ලේකම්වරයා යන පදනමින් ලේකම්වරයා විසින් රැස්වීම් වාර්තා අමාත්‍යාංශයේ ලේකම්වරයාට සහ කොමසාරිස්වරයාට ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

රෝහල සංවර්ධන කමිටුවේ කාර්යයන්

23. ස්ථාපිත කරනු ලබන රෝහල සංවර්ධන කමිටුවේ ක්‍රියාදාමයන් පහත දැක්වෙන පරිද්දෙන් තිබිය යුතු වන්නේ ය.

(i) අදාළ ආයතනය සහ මහජනයා අතරේ සම්බන්ධීකරණය ඇති කිරීම.

(ii) ආයතනයේ සංවර්ධනය සහ සුභසාධන ක්‍රියාකාරකම් සපුරාලීම.

(iii) සේවය ලබන්නන්ට ආයතනය මගින් ගුණාත්මක සේවාවක් ලබාදීමට දායක වීම.

24. (i) සංවර්ධන කමිටුව මාසයකට එක් වතාවක්වත් රැස්විය යුතු ය.

(ii) කමිටුවේ සාමාජිකයෙකු හෝ ඔහුගේ කලත්‍රයා ඇතුළත් පවුලේ කිසිම තැනැත්තෙකු පළාත් දේශීය වෛද්‍ය රෝහල සමග කිසිදු ගිවිසුමක් ඇති කර ගත නොහැකි ය.

(iii) තම කාර්යය ඉටු කිරීමේ දී රෝහල සංවර්ධන කමිටුවේ සාමාජිකයන්, පූර්ව අනුමැතිය නොමැතිව රෝහල තුළට ඇතුළුවීම හෝ රෝහල පරීක්ෂා කිරීම හෝ තම කමිටුවේ සාමාජිකයන් මත අනිසි බලපෑමක් කිරීම නොකළ යුතු වන්නේ ය.

## VII වන කොටස

### පොදු විධිවිධාන

අමාත්‍යවරයා විසින් රීතින් සම්පාදනය කිරීම

25 (i) විෂය භාර අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන රීතින් සම්පාදනය කිරීම කළ යුතු වන්නේ ය.

(අ) උතුරු පළාත තුළ දේශීය වෛද්‍ය ආයතනයන් වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන හා කොන්දේසි.

(ආ) උතුරු පළාත තුළ දේශීය වෛද්‍ය ආයතනයක් වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා ගාස්තු නිර්ණය කිරීම.

(ඇ) යම් තැනැත්තෙකු යම් දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටි.

(ඈ) උතුරු පළාත තුළ දේශීය වෛද්‍ය ආයතනයක් වශයෙන්/දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා භාවිතා කළ යුතු ලේඛන, ආකෘති පත්‍ර සහ අධිකරණයේ නඩු පැවරීම සඳහා උපයෝගී කර ගනු ලබන ආකෘති පත්‍ර.

(ඉ) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන වෙනත් ඕනෑම කරුණක්.

(ii) සම්පාදනය කරනු ලබන සියලුම රීතින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එලෙස ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ දී හෝ එකී රීතින් නිශ්චිත දක්වනු ලැබිය හැකි පසු දිනයක දී හෝ සිට ක්‍රියාත්මක කළ යුතු වන්නේ ය.

(iii) පනවනු ලබන සියලුම රීතින් ගැසට් පත්‍රයෙන් පළ කරනු ලැබීමෙන් පසුව, මාස තුනක් ඇතුළත අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

(iv) එලෙස අනුමත නොකරනු ලැබූ සියලුම රීතින් එය යටතේ කලින් කරනු ලැබූ කිසිවකට අගතියක් නොවන පරිදි එකී අනුමත දිනයේ සිට පරිච්ඡින්න වූ ලෙස සළකනු ලැබිය යුතු වන්නේ ය.

ලේකම්වරයාගේ වගකීම්.

26. මෙම ප්‍රඥප්තියේ කාර්‍ය්‍යය, කර්තව්‍ය සහ බලතල ලේකම්වරයාගේ අධීක්ෂණයට, පරීක්ෂණයට සහ විධිවිධානයන්ට යටත්ව කොමසාරිස්වරයා විසින් ඉටු කළ යුතු වන්නේ ය.

පාඨ අතර අනනුකූලතාවයක් ඇති වූ විට දෙමළ භාෂාපාඨය බලපැවැත්වෙන බව.

27. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨයන් අතර යම් අනනුකූලතාවයක් ඇති වූ විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

අර්ථ නිරූපනය.

28. පද සම්බන්ධයෙන් නිශ්චිත අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම ප්‍රඥප්තියෙහි,

**''පළාත''** යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු පළාත වේ.

**''පළාත් සභාව''** යන්නෙන්, උතුරු පළාතේ පළාත් සභාව වේ.

**"ආණ්ඩුකාරවරයා''** යන්නෙන්, උතුරු පළාතේ ආණ්ඩුකාරවරයා වේ.

**"විෂය භාර අමාත්‍යවරයා''** යන්නෙන්, උතුරු පළාතේ පළාත් සභාවේ දේශීය වෛද්‍ය විෂය පවරා දී ඇති අමාත්‍යවරයා වේ.

**"අමාත්‍යාංශ ලේකම්වරයා''** යන්නෙන්, දේශීය වෛද්‍ය විෂය භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

**"කොමසාරිස්වරයා''** යන්නෙන්, උතුරු පළාත් සභාවේ දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව සඳහා පත් කර ඇති දේශීය වෛද්‍ය කොමසාරිස්වරයා වේ.

**"දේශීය වෛද්‍ය''** යන්නෙන්, ශ්‍රී ලංකාවේ දේශීය පාරම්පරික වෙදකම, ආයුර්වේදය, සිද්ධ, යුනානි, යෝගා ක්‍රමවේදයන් හෝ ශ්‍රී ලංකාවේ විධිමත් අනුමැතිය සමගින් පවත්වාගෙන යනු ලබන වෙනත් විදේශීය රට වලින් පිළිගනු ලබන හෝ ජාත්‍යන්තර වශයෙන් විකල්ප වෛද්‍ය ක්‍රම හෝ වෛද්‍ය ක්‍රම වශයෙන් එකඟතාවයට පත් වූ ස්වාභාවික සහ සම්පූර්ණ බලය සහ අනුරූපී ප්‍රතිකාර ක්‍රම, සුවපත් කරන ශාස්ත්‍රීය සෞඛ්‍ය ප්‍රතිකාර ක්‍රම.

**"දේශීය වෛද්‍ය සේවයේ නිරතවූවන්''** යන්නෙන්, දේශීය වෛද්‍යවරුන්, ඖෂධ නිකුත් කරන්නන්, යෝගා ක්‍රමවේද පුහුණුකරුවන්, උපස්ථායකවරුන් සහ පංචකර්ම තාක්‍ෂණිකයන්, සිරුර මැඩීම කරන්නන් සම්බාහකවරුන්.

**"දේශීය වෛද්‍ය වෘත්තිකයා''** යන්නෙන්, ශ්‍රී ලංකාවේ දේශීය පාරම්පරික වෙදකම, ආයුර්වේදය, සිද්ධ, යුනානි, යෝගා ක්‍රමවේද හෝ ශ්‍රී ලංකාවේ විධිමත් අනුමැතිය සමගින් පවත්වාගෙන යනු ලබන වෙනත් විදේශීය රටවලින් පිළිගනු ලබන හෝ ජාත්‍යන්තර වශයෙන් විකල්ප වෛද්‍ය ක්‍රම හෝ වෛද්‍ය ක්‍රම වශයෙන් එකඟතාවයට පත් වූ ස්වාභාවික සහ සම්පූර්ණ බලය සහ අනුරූපී ප්‍රතිකාර ක්‍රම, සුවපත් කරන ශාස්ත්‍රීය සෞඛ්‍ය ප්‍රතිකාර ක්‍රම වලින් නියුක්ත තැනැත්තන් වන යම් වෘත්තියක් කරන්නා.

**"දේශීය වෛද්‍ය ආයතන''** යන්නෙන් මෙම ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (1) සහ (2) ඡේද යටතේ පෙන්වා දෙන ලද ආකාරයෙන් පළාතේ දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරනු ලැබූ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ දේශීය වෛද්‍ය රෝහල්, ඔසු හල්, ප්‍රතිකාර මධ්‍යස්ථාන, දේශීය වෛද්‍ය පංචකර්ම මධ්‍යස්ථාන, දේශීය වෛද්‍ය ශාරීරික යෝගා සේවා ආයතන, දේශීය වෛද්‍ය ඖෂධ හෝ උපකරණ වෙළෙඳ පොළට අළෙවි කරන අලෙවි ස්ථාන අදහස් වේ.

**"දේශීය වෛද්‍ය නිෂ්පාදන''** යන්නෙන්, සිද්ධ, ආයුර්වේදය, යුනානි හා පාරම්පරික වෛද්‍ය ක්‍රමයට අදාළ බෙහෙත්, රූපලාවන්‍ය ද්‍රව්‍ය හා ආහාර ද්‍රව්‍ය වේ.

04 - 709

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.